# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,888 — 1970 ජනවාරි 9 වැනි සිකුරාද — 1970.1.9**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV වැනි කොටස—පළාත් පාලනය

**(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවලට වෙන වෙනම පිටු අංක යොදා ඇත)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 21 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — | අය-වැය ලේඛන ... ... ... | 22 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 23 |


## පළාත් පාලන නිවේදන

### සුළු නගර සභා ආඥාපනත

**සුළු නගර සභා ආඥාපනතේ 17(1) වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, හලාවත-පුත්තලම් කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලියනගේ ජෝර්ජ් එඩ්වර්ඩ් වික්‍රමසේකර වන මා විසින්, මෙහි පහත සඳහන් උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සුළු නගර සභාවට සභාපතිවරයෙකු පත් කර ගැනීම සඳහා 2 වැනි තීරයේ සඳහන් දිනයෙහි දී 3 වැනි තීරයේ සඳහන් වේලාවේදී 4 වැනි තීරයේ සඳහන් ස්ථානයේදී රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

එල්. ජී. ඊ. වික්‍රමසේකර,<br>
පළාත් පාලන සහකාර කොමසාරිස්,<br>
හලාවත-පුත්තලම් කොට්ඨාශය.

1969 ක්වූ දෙසැම්බර් මස 31 වැනි දින,<br>
හලාවත, පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| සුළු නගර සභාවේ නම | දිනය | වේලාව | ස්ථානය |
| නාත්තන්ඩිය ... | 1970. 1.18 ... | පෙරවරු 10 ... | නාත්තන්ඩිය සුළු නගර සභා කාර්යාලය, නාත්තන්ඩිය |

1-220—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1968 දෙසැම්බර් මස 14 වැනි දින,<br>
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.<br>
කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,<br>
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

---

## ගම්සභා ආඥාපනත

### ගම්සභා ආඥාපනතේ 17(1) වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ජයනාදිපතිගේ ගුණපාල කීර්තිරත්න වන මා විසින් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් ගම් සභාවල සභාපතිවරුන් පත් කර ගැනීම පිණිස II වැනි තීරුවෙ සඳහන් දිනයේදී III වැනි තීරුවේ සඳහන් වේලාවේදී IV වැනි තීරුවේ සඳහන් ස්ථානයේදී ප්‍රථම රැස්වීම මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල කොට්ඨාශය.

1969 දෙසැම්බර් මස 27 වැනි දින,
කෑගල්ල පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| I වැනි තීරුව<br>ගම් සභාවේ නම | II වැනි තීරුව<br>දිනය | III වැනි තීරුව<br>වේලාව | IV වැනි තීරුව<br>ස්ථානය |
|---|---|---|---|
| 1. දුරණියගල ... | ... 1970. 1.17 ... | පෙ. ව. 11. ... | දුරණියගල පිහිටි දුරණියගල ගම් සභා කාර්යාලයේදීය |
| 2. දෙහිගම්පල් කෝරළේ එගොඩපතපත්තු | 1970. 1.18 ... | පෙ. ව. 10. ... | ඉඹුලානේ පිහිටි දෙ. කෝ. එගොඩපතපත්තු ගම්සභා කාර්යාලයේදීය |

1–241—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

# අය - වැය ලේඛන

## මාවනැල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (ii) යටතේ කෙරෙන අයදුම්පත

1969.12.31 වෙනි දිනට, 1969 වර්ෂයේ අය–වැය ලේඛනයේ පහත සඳහන් වැය ශීර්ෂයන්ගේ වෙන් කර ඇති මුදල් ඉතිරි වන හෙයින්, එම ඉතිරි මුදල් 1969.12.31 වෙනි දිනට වෙන් කර ඇති මුදල් ඉක්මවා යා හැකි පහත සඳහන් වැය ශීර්ෂයන්ට, සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (ii) අනුව මාරු කිරීම සුදුසුයයි සභාපති, ඒ. ඇල්. ඇම්. යුසුෆ්ප් මහතා කළ යෝජනාව ඇම්. අයි. ඇම්. සුබයිර් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂයන් | රු. | ශ. | වැඩිපුර මුදල් අවශ්‍ය වැය ශීර්ෂයන් | රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී.—11 ... ... | 125 | 0 | ඒ.—1 (ජී) ... ... | 25 | 0 |
| ඩී.—3 (සී) ... ... | 200 | 0 | බී.—13 ... ... | 50 | 0 |
| | | | ඒ.—2 (ඇෆ්) ... | 224 | 35 |
| | | | ඩී.—6 (බී) ... ... | 25 | 65 |
| | 325 | 0 | | 325 | 0 |

1969 දෙසැම්බර් මස 27 වෙනි දින පැවැත්වූ මාවනැල්ල සුළු නගර සභාවේ රැස්වීමේ අංක 8(i) දරණ යෝජනාවේ සත්‍ය පිටපතකි.

ඒ. ඇල්. ඇම්. යුසුෆ්ප්,
මාවනැල්ල සුළු නගර සභාවේ සභාපති.

1969.12.28 වෙනි දින,
මාවනැල්ල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

අනුමත කරන ලදී.

ජේ. ජී. කීර්තිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

1969 දෙසැම්බර් 31 වැනි දින,
කෑගල්ල, පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

1–380—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## කළුතර නගර සභාව

### 1969—4 වෙනි පරිපූරක අය–වැය ලේඛනය

| වැය ශීර්ෂය හා උප වැය ශීර්ෂය | | මුදල රු. | ශ. | සභාවේ අනුමතිය |
|---|---|---|---|---|
| ඒ.—2 (ඒ) (1) | ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 2,020 | 0 | ... 69.12.22 වෙනි දින සභා සම්මුති අංක 24 |
| ඒ.—2 (ඊ) | නීතිඥ ගාස්තු ... ... | 1,500 | 0 | ... එම |
| ඩී.—7 | නගර සභා ගොඩනැගිලි හා ඉඩම් අළුත් වැඩ ... | 8,000 | 0 | ... එම |
| ඩී.—7 | නගර සභා ගොඩනැගිලි හා ඉඩම් අළුත් වැඩ ... | 1,200 | 0 | ... 69.11.22 වෙනි දින සභා සම්මුති අංක 33 |
| ඊ.—2 (ඊ) | ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... | 250 | 0 | ... 69.11.22 වෙනි දින සභා සම්මුති අංක 24 |
| ඊ.—3 (එච්) | ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර ... | 250 | 0 | ... එම |
| ඊ.—6 (බී) | ආරෝග්‍ය ශාලා නඩත්තු කිරීම ... | 10,000 | 0 | ... එම |
| ඊ.—1 (ඒ) | වේතන—වින්නඹු මාතාවන් හා පරීක්ෂකවරුන් | 1,000 | 0 | ... 69.11.22 වෙනි දින සභා සම්මුති අංක 17 |
| | | 24,220 | 0 | |

ඇම්. ආර්. ඩයස්,
වැඩ බලන සභාපති,
කළුතර නගර සභාව.

1969 දෙසැම්බර් මස 27 වෙනි දින,
කළුතර, නගර සභා කාර්යාලයේ දී ය.

1–498—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ජාඇල පළාත් ආණ්ඩු සභාව

### ගෝ ඝාතක ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1970 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බැවින්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන ජාඇල පළාත් ආණ්ඩු සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | වෙළඳාම | | ස්ථානය |
|---|---|---|---|---|---|
| 1. | ඩබ්ලිව්. සිමියොන් රණසිංහ, යක්කඩුව, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | ජාඇල පොදු වෙළඳ පොළේ අංක 52 දරණ මස් කඩය |
| 2. | ඇම්. ඩී. විලියොන් අප්පුහාමි, යක්කඩුව, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | ජාඇල පොදු වෙළඳ පොළේ අංක 53 දරණ මස් කඩය |
| 3. | පී. ගිරිගෝරිස් සිල්වා, බටගම උතුර, ජාඇල | ... | ඌරු මස් | ... | ජාඇල පොදු වෙළඳ පොළේ අංක 54 දරණ මස් කඩය |
| 4. | ටී. ප්‍රැන්සිස් ප්‍රේරා, මාඑළිය, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | වැලිගම්පිටිය හන්දිය මස් කඩය |
| 5. | ටී. ප්‍රැන්සිස් ප්‍රේරා, මාඑළිය, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | හෙට්ටිගම හන්දිය මස් කඩය |
| 6. | ටී. ප්‍රැන්සිස් ප්‍රේරා, මාඑළිය, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | කණුවන (ගම්මැද) මස් කඩය |
| 7. | ඇන්. ඒ. කුරේ, බටගම උතුර, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | වැලිගම්පිටිය (බටගම පාර) මස් කඩය |
| 8. | ඇම්. ජෝර්ජ් පෙරේරා, මීගමු පාර, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | රිලවුල්ල හන්දිය මස් කඩය |
| 9. | ඇම්. ජෝර්ජ් පෙරේරා, මීගමු පාර, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | කළුඑළිය හන්දිය මස් කඩය |
| 10. | ඇම්. ජෝර්ජ් පෙරේරා, මීගමු පාර, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | කණුවන හන්දිය මස් කඩය |
| 11. | කේ. පිලික්ස් පෙරේරා, තුඩැල්ල, ජාඇල | ... | හරක් මස් සහ එළු මස් | ... | තුඩැල්ල මස් කඩය |

ඇම්. ජෝසප් මයිකල් පෙරේරා,
සභාපති,
ජාඇල පළාත් ආණ්ඩු සභාව.

1969 දෙසැම්බර් මස 31 වැනි ද,
ජාඇල පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දී ය.

1–378—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## කාක්කාපල්ලිය ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1970 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩයක් පවත්වාගෙනයාමට බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති බැවින් ඒ අනුව බලපත්‍රය නිකුත්කිරීම ගැන කාක්කාපල්ලිය ගම්ප්‍රදේශයේ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධවීමට හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූදින සිට දින 14 ක් ඇතුලත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධන පණතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙමි.

ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු,
කාක්කාපල්ලිය ගම්සභාවේ සභාපති.

ගම්සභා කායර්‍යාලය, කාක්කාපල්ලිය,
1970.1.2.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | වෙළඳාමේ විස්තර | | ස්ථානය |
|---|---|---|---|---|
| සෙයියදු ඉබ්‍රහිම් මොහමමදු සාලි, සවරාන, හලාවත | ... | එළුහරක් මස් | ... | සවරාන |

1–381—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## යටිනුවර ගහ පළාත ගම්සභාව

### ගම්සභා ආඥපනත (257 වැනි අධිකාරය)

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගහ පළාත ගම්සභාව විසින් 1969.12.21 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙමි.

ටී. බ. දිසානායක,
යටිනුවර ගහ පළාත ගම්සභාවේ සභාපති කැන.

1969 ක්වූ දෙසැම්බර් මස 31 වැනි දින,
මුරුතලාව,
ගම්සභා කාර්යාලය.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා පොදු අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගහ පළාත ගම්සභාව විසින් 1953 දෙසැම්බර් මස 11 වැනි දින අංක 10,621 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකර වලංගු වන අයුරු පනවා ඇති පොදු අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ (1) වැනි අතුරු ව්‍යවස්ථාව අනුව මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් කර ඇති දිග පළල අනුව සාද හෝ නැවත සාද ගැනීම හෝ ප්‍රතිසංස්කරණය කර ගැනීම හෝ පවත්වාගෙන යාම කළයුතු යයි අංක 16 කොට්ඨාශයේ සභික සභාපති ටී. බී. දිසානායක මහතා කළ යෝජනාව, අංක 5 කොට්ඨාශයේ සභික ඩී. ඇම්. රණසිංහ මහතාගේ ස්ථිරත්වය පිට ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.

උපලේඛනය

| අංකය | පාරේ නම | පාරේ විස්තර | පාරේ පළල අඩි සිට දක්වා | පාරේ දිග ද. | යාර |
|---|---|---|---|---|---|
| | | **අංක 1—බුළුමුල්ල කොට්ඨාශය** | | | |
| 1. | වලගම ඕවිල පාර | පොල්ගහමුල අලදෙනිය පාරේ සැ. 5හේ අසල මල්වත්ත නමැති ඉඩමේ සිට වලගම ආවාසය හරහා කෙහෙල්වල පාසැලට අයිති ලැල්ලාව ඉඩමේ පිහිටි බෝධිය දක්වා | 3—5 | 60 | 0 |
| | | **අංක 5—ඒදඬුවාව කොට්ඨාශය** | | | |
| 2. | ගාල්කුඹුර-දඹහිටියාව පාර | අන්දන්ගම කිරිබත්කුඹුර පාරේ ගාල්කුඹුර ලඟින් පටන්ගෙන ඇලවේල්ල දිගේ කුඹුක්ගහමුල කඩේ ඉදිරිපිටින් දඹහිටියාව පාර දක්වා | 5—7 | 40 | 0 |
| 3. | ඒදඬුවාව-ගොඩගන්දෙනිය පාර | ඒදඬුවාවේ කෙහෙල්පතංග කමත ලඟින් පටන්ගෙන පොල්ගහ කුඹුර, මැද්දේ කුඹුර, ඉඹුලාදෙනිය කුඹුර ආදී කුඹුරුවල ඇලවේල්ල දිගේ ගොඩගන්දෙනිය පාර දක්වා | 4—6 | 35 | 0 |
| 4. | පුරාණ පන්සල් පාර | අන්දන්ගම දඹහිටියාව පාරේ ඒදඬුවාව විහාරස්ථානය ඉදිරිපිටින් පටන්ගෙන කිරි මැටියේ වත්ත දිගේ පාගොඩ වත්තෙන් කොළඹ නුවර දුම්රිය පාරේ 70¼ලේ සැතපුම් කණුව අසල සං ඥ කණුව අසලින් දුම්රිය පාරතෙක් | 4—6 | 12 | 0 |
| 5. | මහා විද්‍යාල පාර | අන්දන්ගම දඹහිටියාව පාරේ ගල්කොටුව ඉඩම අසලින් පටන්ගෙන පොල්ගහකුඹුර කහඹිලියාව හරහා පේරාදෙනිය මහා විද්‍යාල ඉඩම දක්වා | 5—6 | 30 | 0 |
| | | **අංක 9—පැලව පහළ කොට්ඨාශය** | | | |
| 6. | පැලව පහළගම වාලිංගාදෙනිය ගල් අංග අමුනේවල පාර | පොල්ගහමුල අලදෙනිය පාරේ 3 වැනි සැතැපුම් කණුව අසල සිට මහනුවර දෙසට යාර 400 ක් ගිය තැනින් පටන්ගෙන පැලව පහළගම හරහා ගන්නොරුව අමුනේ වල කුඹුරෙන් ගන්නොරුව අමුනේවල පාර නොහොත් ගන්නොරුව මුරුතලාව පාර දක්වා | 12 | 200 | 0 |
| | | **අංක 12—කොබ්බෑකඩුව කොට්ඨාශය** | | | |
| 7. | ගලහිටියාව-ගල්අංග පාර | කොබ්බෑකඩුව කුම්පනේ පාරේ රජමහවිහාරයට අයිති අංක 103ජ් දරණ ස්ථානයේ සිට ගලහිටියාව කුඹුර හලුගෙදර කුඹුර සහ ගල්අංගේ කුඹුර යන ඉඩම්වල නියර දිගේ ගොස් හතර කෝරළේ ගෙදර දුනට විලියම් මහතා පදිංචි අංක 86 ඒ දරණ ස්ථානය දක්වා | 4—6 | 11 | 18 |
| | | **අංක 13—මංගලගම කොට්ඨාශය** | | | |
| 8. | දියපලාගොඩ කොස්අංගේ පාර | අලකොලංග මුරුතලාව පාරේ දියපලාගොඩ ඩී. ජී. රන්කිරා මයා. ගේ ගෙදර අසලින් පටන්ගෙන දියපලාගොඩ මල්ගම්මන ගම් මායිම දිගේ ගොස් පිටඅංගේ වත්ත තැන්නේ වත්ත අගල් දිගේ පීටර්ගේ ගේ ඉදිරිපිටින් කිරිහාමිගේ දෙනියේ පිලේ වේල්ල දිගේ දනට තිබෙන ගම්සභා පාර වන කොස්අංගේ වේල්ල දක්වා | 2—6 | 20 | 0 |
| 9. | වැලිපැල වරදන්තැන්න හරහා ඉඩම් පිටිය පාර | දියපලාගොඩ වැලිපැලේ කුඹුරේ පිට පොල්ගහ ලඟින් පටන්ගෙන වරදන්තැන්න වත්තෙන් දකුණට හැරී බිංදුවා බාස්ගේ ගේ ඉදිරිපිටින් බුලත්වැල් කොටුව පින් පැල ඉඩම්වල මායිම් දිගේ මුදුනේ වත්ත කෙලවරදී ඉඩම්පිටිය කැටලේ පාරට | 2—3 | 14 | 0 |
| 10. | කහවතුගොඩ ගිනිගත් ගොඩේ කොට පල පාර | අලකොලංග මුරුතලාව පාරේ 2කේ කණුව අසලින් පටන්ගෙන ගිනිගත්ගොඩේ ඉඩමෙන් උතුරු මායිම දිගේ විමලසේන වික්‍රමනායක මහතාගේ නිවස ආයුර්වේද වෛද්‍ය කේ. ඩබ්. ජී. ගුනතිලක මහතාගේ සහ ගුනපාල කල්කානමගේ නිවෙස් ඉදිරිපිටින් ගොස් පල්කඩේ වේල්ලට වැටී එම වේල්ල දිගේ උඩමහකුඹුර දෙපැ වේල්ල දිගේ මුරුතලාව රන්දිපොල ගම්සභා පාරේ උඩමහකුඹුර දක්වා | 3—5 | 22 | 0 |
| 11. | දියපලාගොඩ කටුපුල්ලැකුඹුර පාර | කිරිබත්කුඹුර දියපලාගොඩ පාරේ දියපලාගොඩ ඩබ්. ජී. සයිමන් මහතාගේ ගේ අසලින් පටන්ගෙන එම ඉඩමේ මායිම් අගලදිගේ හෙට්ටිවත්තේ බබානිස් මහතාගේ නිවස ඉදිරිපිටින් වමට හැරී අඹ අංගේ කිරා මහතාගේ නිවස ඉදිරිපිටින් මැණිකා මහතාගේ හෙට්ටිවත්ත දෙවටින් දකුණට හැරී බෝලියා මහතාගේ ඉඩමෙන් දුම්බරගේ කිරා මහතාගේ නිවස අසලින් අඹඅංගේ කිරා මහතාට අයිති හෙට්ටිවත්තේ කුඹුරේ ඉම වේල්ල දිග ඒ. බී. අත්තනායක මහතාට අයිති මැද වත්තේ ඉඩමෙන් ගොස් රඹුක් අංගඉම වේල්ල දිග රන්දිපොල මුරුතලාව ගම්සභා පාරේ මංගලගම කටුපුල්ලැකුඹුර දක්වා | 2—5 | 15 | 0 |
| 12. | මංගලගම කුරඹේපාර | ඉඩම්පිටිය මංගලගම හරහා දෙහිගම පාරේ ගල්පොත්තේ කඩේ අසලින් පටන්ගෙන මානාගොඩේ වත්තෙන් එගොඩ ජයවර්ධනාරාමය අසලින් මානාගොඩේ දෙවැට දිගේ ගොස් පියදස මහතාගේ නිවස අසලින් සූරියගොඩ ඉඩම්පිටිය ගම්සභා පාරේ කුරඹේ ඉඩම දක්වා | 3—6 | 25 | 0 |
| 13. | මංගලගම අස්වැද්දුමේ පාර | ඉඩම්පිටිය මංගලගම හරහා දෙහිගම පාරේ කුකුල්දගොඩේ බෝධිය අසලින් පටන් ගෙන අස්වැද්දුමේ විජේරත්න මහතාගේ නිවස ඉදිරිපිටින් දකුණට හැරී දෙපා ඇල වේල්ලට බැස එම වේල්ල දිගේ එගොඩට ගොස් ස්වර්ණතිලක බාස් උන්නැහේ ගේ නිවස අසලින් රතමේගොඩ වත්ත අසලින් සූරියගොඩ පාරට | 2—4 | 18 | 0 |
| | | **අංක 15—මල්ගම්මන කොට්ඨාශය** | | | |
| 14. | කුරුඅඹගහවත්ත කලල්දෙර පාර | ඉඩම්පිටිය කැටලේ ගම්සභා පාරේ කුරුඅඹගහ වත්තේ පටන්ගැනීමේ සිට දෙඩම් පිටිය වත්ත ගබඩාගේ කුඹුරේවත්ත නෙල්ලිගොඩේ වත්ත මායිම දිගේ මුරුතලාව රන්දිපොල ගම්සභා වේල්ල කලල්දෙර කුඹුර තෙක් | 3—6 | 20 | 0 |
| | | **අංක 20—පහළ ඊරියගම බටහිර කොට්ඨාශය** | | | |
| 15. | දෙමළ පාසැල ලඟ සිට ගල්වල පාරට යන මෙගොඩ ඇල පාර | පැණිදෙනිය ගම්පල පාරේ අංක 5/10 දරණ බෝක්කුව අසලින් පටන්ගෙන මඩදෙල් පොතේ කුඹුර හා බක්මී අංග කුඹුරු අතරින් ගොස් මුත්තෙට්ටුපැල අළුපොතේ ඉඩම අසලින් බටහිර දෙසට හැරී පිලිඅංග ඉඩම හා ගිරා අංක කුඹුර අතරින් ගල්වළ පාරේ 1/2 දරණ බෝක්කුව අසලින් ගල්වළ පාර දක්වා | 2—4 | 3[illegible] | 10 |

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය ඊට ඉදිරියෙන් ඇති ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන තිස්පනේ කෝරළයේ ගම්සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුඩ වන්නේ නම් ඒ කුමණ කරුණක් නිසාද යන වග ඇතුලත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 අධිකාරය 7 (2) වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

යූ. බී. ජයසුන්දර,
තිස්පනේ ගම්සභාවෙ සභාපති.

*1969.12.27* දින,
වටද්දර, තිස්පනේ ගම්සභා කාර්යාලයේ දීයැ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|
| යූ. ජේනුල් ආබදීන්, හපුගස්තලාව ... | එළ හරක් මස් වෙළඳාම ... | කළුදැමඩ, හපුගස්තලාව |

1–370—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## හෙනරත්ගොඩ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ හෙනරත්ගොඩ ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුද්ධ වන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය ඇති බවත් ගෝඝාතක ආඥපනතේ 272 වන අධිකාරයේ අංක 7 දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇන්. කැලිස්ටස් ජෝෂප් සිල්වා, පාසැල් පාර, බටුවත්ත | හරක් මස් හා ඌරුමස් ... | ගණේමුල්ල පොදුවෙළඳ පොල භූමියේ අංක 1 දරණ ගම් සභාව සතු කඩ කාමරය |

පී. ඒ. පෙරේරා,
සභාපති, හෙනරත්ගොඩ ගම් සභාව.

ගම්සභා කාර්යාලය, හෙනරත්ගොඩ–මුදුන්ගොඩ,
1969.12.27

1–375—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### මුදල් රෙගුලාසි නීති අංක 12 (12) යටතේ කෙරෙන අයදුම

1969 අය-වැය ලේඛනයේ පහත සඳහන් වැය සිරස්වලට වෙන් කරන ලද මුදල්වලින් ඉතිරිවේයැයි ගණන් බලන ලද මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය සිරස්වලට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම සිරස් යටතේ යෙදීමට 1969 අගෝස්තු 26 දින ගම්පහ නගර සභා රැස්වීමේ අංක 14 සම්මුතියෙන්ද 1969 සැප්තැම්බර් 9 දින අංක 6 සම්මුතියෙන්ද, 1969 ඔක්තෝබර් 31 දින අංක 9 සම්මුතියෙන්ද, 1969 දෙසැම්බර් 15 දින අංක 2 සම්මුතියෙන්ද අනුමත කරන ලදී.

#### ඉතිරි වේයැයි බලාපොරොත්තුවන වැය සිරස

| | රු. | ශ. |
|---|---|---|
| ඩී.—නගර සභා ගොඩනැගිලි සහ ඉඩම් :— | | |
| 7. නව කර්මාන්ත ... ... ... | 77,700 | 0 |
| ඊ.—මහජන සුවය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (ජී) වතුර බැස්වීමේ කානු තැනීම ... ... | 6,150 | 0 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව :— | | |
| 1. විදුලි බල නිපැයුම— | | |
| (ඒ) විදුලි බලය මිලයට ගැනීම ... ... | 6,700 | 0 |
| 2. අළුත්වැඩියා කිරීම හා නඩත්තුව— | | |
| (ඒ) ගොඩනැගිලි ... ... ... | 100 | 0 |
| 10. ජීවනාධාර දීමනා ... ... ... | 2,700 | 0 |
| | 93,350 | 0 |

#### වැඩිපුර වැයවේයැයි බලාපොරොත්තුවන වැය සිරස

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 300 | 0 |
| (බී) ලිපිකරුවන් සහ අය පිරික්සුවන් ... ... | 5,800 | 0 |
| (සී) පියන්වරු ... ... ... | 650 | 0 |
| 2. ආයතන සහ සේවා මඩුලු වැය— | | |
| (ඒ) අමතර දීමනා ... ... ... | 500 | 0 |
| (ජේ) නිවාඩු දුම්රිය අවසරපත් ... ... | 1,500 | 0 |
| (ඇම්) අතිකාල දීමනා ... ... | 500 | 0 |
| බී.—පොදු මංමාවත් :— | | |
| 1. වැටුප් සහ පඩිනඩි— | | |
| (ඒ) වැඩ පරිපාලක තැන (වේතන සහ අමතර දීමනා) | 1,100 | 0 |
| (බී) ඕවර්සියර්වරු ... ... ... | 300 | 0 |
| (සී) කම්කරුවන් ... ... ... | 1,500 | 0 |
| 2. නඩත්තුව ... ... ... | 2,000 | 0 |
| 4. විදි එළිය කිරීම ... ... ... | 10,000 | 0 |
| 8. සංවර්ධන වැඩ ... ... ... | 4,200 | 0 |
| සී.—තානායම් සහ අම්බලම් :— | | |
| 1. වැටුප් ... ... ... | 1,000 | 0 |
| 2. නඩත්තුව ... ... ... | 2,000 | 0 |
| 3. ගෘහ භාණ්ඩ සහ උපකරණ ... ... | 3,000 | 0 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| 1. වැටුප් ... ... ... | 700 | 0 |
| 4. නඩත්තුව ... ... ... | 6,000 | 0 |

**වැඩිපුර අයවෙයයි බලාපොරොත්තුවන වැය සිරස**

| | රු. | ශ. |
|---|---|---|
| ඊ.—මහජන සුවය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඒ) වැටුප් (පිරික්සුවන් සහ වින්නඹු මාතාව) ... | 500 | 0 |
| 2. කසළ සෝධනය— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 6,500 | 0 |
| (බී) කරත්ත, ගොනුන් සහ ලොරි ... ... | 5,000 | 0 |
| (ඊ) ජීවනාධාර දීමනා ... ... | 7,000 | 0 |
| 3. වැසිකිළි ශුද්ධ කිරීම— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 5,000 | 0 |
| 5. ජලසම්පාදනය— | | |
| (සී) නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| 7. වෙළඳ පොලවල් හා ගාල්— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 1,300 | 0 |
| (බී) නඩත්තුව ... ... ... | 9,000 | 0 |
| (ජී) ණය ගෙවීම් ... ... ... | 1,250 | 0 |
| ඈෆ්.—පොදු ක්‍රීඩා :— | | |
| 1. පඩිනඩි ... ... ... | 200 | 0 |
| 2. නඩත්තුව ... ... ... | 4,000 | 0 |
| ජී.—සොහොන් බිම් :— | | |
| 1. පඩිනඩි ... ... ... | 400 | 0 |

**වැඩිපුර අයවෙයයි බලාපොරොත්තුවන වැය සිරය**

| | රු. | ශ. |
|---|---|---|
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව :— | | |
| 3. පාරිභෝගික සේවා වියදම්— | | |
| (ඒ) ද්‍රව්‍ය ... ... ... | 2,000 | 0 |
| (බී) තාවකාලික කම්කරුවන් ... ... | 700 | 0 |
| 4. පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) පඩිනඩි ආදිය (විදුලි කාර්මිකයින් සහ ලිපිකරුවන්) | 1,500 | 0 |
| (බී) පඩිනඩි ආදිය (පිට වැඩ කරුවන්) ... | 3,000 | 0 |
| (සී) මුද්‍රණ වැඩ සහ ලිපි ද්‍රව්‍ය ... ... | 500 | 0 |
| (ජී) අතිකාල ... ... ... | 1,700 | 0 |
| 5. ණය ගෙවීම්— | | |
| (බී) ණයමුදල් වලින් ගෙවන කොටස ... | 200 | 0 |
| 8. ආපසු ගෙවීම් ... ... ... | 100 | 0 |
| ඇම්.—කියවීම් ශාලා :— | | |
| 1. පඩිනඩි ... ... ... | 1,450 | 0 |
| | 93,350 | 0 |

ඩී. ජී. වීරතුංග,
සභාපති,
ගම්පහ නගර සභාව.

නගර සභා කාර්යාලය,
ගම්පහ, 1969 දෙසැම්බර් 31.

1-368—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛන

1970 වර්ෂය සඳහා වූ ගලේවෙල සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සුදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වෙනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දීය.

1-373—70.1.11 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල නගර සභාව

### 1969 වර්ෂයේ තක්සේරු බදු ලේඛන

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 166 වැනි වගන්තිය (252 වැනි අධිකාරය වන) නාගරික සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය සමග කියැවෙන පරිදි, 1970 වර්ෂය සඳහා කෑගල්ල නගර සභාවේ තක්සේරු බදු ලේඛන දනට සුදානම්ව ඇති බැවින්, එම ලේඛන නියමිත කාර්යාල වේලාවන්හි දී මෙම නගර සභා කාර්යාලයේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පු. බ. බාලසූරිය,
සභාපති,
කෑගල්ල නගර සභාව.

1970 ජනවාරි 2 දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේදී.

1-371—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## මුල්ලේරියාව සුළු නගර සභාව

### 1969 වරිපනම් ලේඛනය

1970 වර්ෂය සඳහා මෙම සුළු නගර සභාවේ වරිපනම් ලේඛනය දනට සූදානම්කර ඇති බවත්, එම ලේඛනය කාර්යාල වේලාවන්හි දී මෙම කාර්යාලයේ දී බදු ගෙවන්නන් විසින් පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත් 256 වැනි අධිකාරය වූ සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ අංක 235 (1) හා (2) දරණ වගන්තිය අනුව මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. ඩී. නෙල්සන් නන්දතිලක,
සභාපති,
මුල්ලේරියාව සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
මුල්ලේරියාව, අංගොඩ.
1969. 12. 31.

1-372—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1970.1.1 දින සිට 1970.12.31 දින දක්වා කාලයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බැවින්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන ගම්පහ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කිරීමට අදහස් කරන ස්ථානය |
|---|---|
| 1. ඇම්. ඒ. ඩයස්, 203, වැලි වේරිය | ගම්පහ පොදු වෙළඳ පොලේ අංක 16 දරණ එළුමස් කඩය හා අංක 19 දරණ හරක් මස් කඩය. |
| 2. ජේ. වී. සෝමපාල, 34, කුමාර තුංග මාවත, ගම්පහ | ගම්පහ පොදු වෙළඳ පොලේ අංක 17 දරණ හරක් මස් කඩය සහ අංක 18 දරණ ඌරු මස් කඩය. |

ඩී. ජී. වීරතුංග,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

1969 දෙසැම්බර් 31 දා,
ගම්පහ පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

1-377—70.1.9 දින අංක 14,888 දරණ ගැසට් පත්‍රය

## කන්තලේ ගම් සභාව

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් 1970 වර්ෂයට මස්කඩයක් පවත්වා ගෙන යාම සඳහා බල පත්‍ර ඉල්ලුම්කර සිටින හෙයින් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැණ කන්තලේ ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුධ වන්නේනම් එසේ විරුධවීමට ඇති හේතු සඳහන්කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 වැනි පරිච්ඡෙදයේ අංක 7 දරන ආඥපනතින් සංශෝධිත අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඇම්. කිරිබන්ඩා,
කන්තලේ ගම්සභාපති.

ගම්සභාව, කන්තලේ, 1970.1.2 වැනි දින.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| ඇම්. ඒ. රෂාක් ... ... | ... අංක 154, යුනිට් 2, පේරාරු, කන්තලේ | ... හරක්මස් | ... අංක 86 දරණ වත්තේ |

1—367—70.1.9දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## හලාවත දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානවල 1970 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන හලාවත දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටින සේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවුන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. ඇම්. ප්‍රැන්සිස් අප්පුහාමි, වීරගේන, මාරවිල ... | හරක්මස්, එළුමස්, ඌරුමස් ... | මාරවිල නගරයේ පිහිටි අංක 1 දරන මස්කඩය |
| 2. ඇල්. ඒ. හියුබට්, වීරහේන, මාරවිල ... | හරක්මස්, එළුමස්, ඌරුමස් ... | මාරවිල නගරයේ පිහිටි අංක 2 දරන මස්කඩය |
| 3. ඩබ්. පර්සි ප්‍රනාන්දු, බිංගිරිය ... ... | හරක්මස්, එළුමස්, ඌරුමස් ... | මහවැව නගරයේ පිහිටි අංක 6 දරන මස්කඩය |
| 4. ඩබ්. ඇම්. ප්‍රනාන්දු, බිංගිරිය ... ... | හරක්මස්, එළුමස්, ඌරුමස් ... | තොඩුවාවේ පිහිටි අංක 8 දරන මස්කඩය |
| 5. ඩබ්. ඇම්. ප්‍රනාන්දු, බිංගිරිය ... ... | හරක්මස්, එළුමස්, ඌරුමස් ... | මට්ටාකොටුවේ පිහිටි අංක 9 දරන මස්කඩය |
| 6. ඩබ්. පී. බැසිල් ඇන්ටනි, මාරවිල... ... | හරක්මස්, එළුමස්,ඌරුමස් ... | මාරාවිල වැල්ල පිහිටි අංක 10 දරන මස්කඩය |
| 7. ඇම්. ඇම්. අයිවන් පාරිස්, හොරගොල්ල, මාරවිල ... | හරක්මස්, එළුමස්, ඌරුමස් ... | හොරගොල්ල පිහිටි අංක 11 දරන මස්කඩය |
| 8. ඇම්. එච්. ලදිස් ලාවුස් අප්පුහාමි හොරගොල්ල, මාරවිල ... | හරක්මස්, එළුමස්, ඌරුමස් ... | තල්විල පිහිටි අංක 12 දරන මස් කඩය |

ඒ. වික්‍රමාරච්චි,
යටකලන්පත්තු ගම්සභාපති.

1969 ක්වූ දෙසැම්බර් මස 27 වැනිදින,
මාරවිල හත්තිනියේ පිහිටි, යටකලන්පත්තු ගම්සභා කායඞාලයේ දීය.

1—364—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් විකිණීමට 1970 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව වෙන්නප්පුව සුළු නගර සභා සීමාව ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 7 දින ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත වූ 272 වන අධිකාරයේ අංක 7(2) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

සිඩ්නි, ජේ. ප්‍රනාන්දු,
සභාපති, වෙන්නප්පුව සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය, වෙන්නප්පුව,
1969 දෙසැම්බර් 31 දින.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|---|
| පී. ඇන්ටනි මයිකල් ප්‍රනාන්දු ... | ඒදන්ඩ පාර, වෙනන්ප්පුව ... | වෙන්නප්පුව පොදු වෙළඳ පොලේ අංක 1 දරන හරක් මස් කඩය |
| ඩබ්ලිව්. ජුවන් ප්‍රනාන්දු ... ... | උල්හිටියාව, වෙන්නප්පුව ... | වෙන්නප්පුව පොදු වෙළඳ පොලේ අංක 2 දරන එළු මස් කඩය |
| කේ. ලයනල් පෙරේරා ... ... | උල්හිටියාව, වෙන්නප්පුව ... | වෙන්නප්පුව පොදු වෙළඳ පොලේ අංක 3 දරන ඌරුමස් කඩය |
| පී. ඩී. ඇන්ටනි ... ... | උල්හිටියාව, වෙන්නප්පුව ... | වෙන්නප්පුව රා තැබෑරුම අසල හරක්, එළු සහ ඌරු මස් කඩය |
| කේ. ලයනල් ජෝර්ජ් පෙරේරා ... | මිනිපිටිය පාර, වෙන්නප්පුව ... | වෙන්නප්පුව කොස්ගස් හංදිය අසල හරක්, එළු සහ ඌරු මස් කඩය |

1—379—70.1.9 දින අංක 14,888 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

## උපලේඛනය

## 1970

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි ... | 70. 1. 2 | සිකුරාද ... | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1. 9 | සිකුරාද ... | 70. 1. 2 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 1.16 | සිකුරාද ... | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 1.23 | සිකුරාද ... | 70. 1.16 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 1.29 | බ්‍රහස්පතින්ද ... | 70. 1.21 | බදාදා | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද ... | 70. 1.28 | බදාදා | ප.ව. | 3.30 |
| | 70. 2.13 | සිකුරාද ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | 70. 2.20 | සිකුරාද ... | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 2.27 | සිකුරාද ... | 70. 2.20 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද ... | 70. 2.27 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | 70. 3.13 | සිකුරාද ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 | සිකුරාද ... | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 | බ්‍රහස්පතින්ද ... | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 දෙසැම්බර් 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි